තොරතුරු පත්‍රිකාව

2020 මැයි 01

**යාවත්කාලීන කිරීම: ඇමරිකා එක්සත් ජනපදය COVID-19වෛරසයට ප්‍රතිචාර දැක්වීම සඳහා තවදුරටත් නායකත්වය ලබාදෙයි**

ඇමරිකානු ජනතාවගේ ත්‍යාගශීලීත්වය සහ ඇමරිකානු රජයේ ක්‍රියාමාර්ග හරහා ඇමරිකා එක්සත් ජනපදය COVID-19 වසංගතයට මුහුණදීමේදී ගෝලීය වශයෙන් අඛණ්ඩව නායකත්වය පිළිබිඹු කරයි. දේශීය වශයෙන් මෙන්ම විදේශ රටවල ද මෙම වංගතයට එරෙහිව සටන් වදින්නට ගෙන මාස කිහිපයක් ගතවී ඇති පසුබිමක් තුළ, දිවි ගලවාගන්නා සෞඛ්‍ය හා මානුෂීය උපකාර ලබාදීම සම්බන්ධයෙන් දශක ගණනාවක් ඇමරිකාව ලබාදුන් නායකත්වය මත පදනම් වෙමින් තවදුරටත්, ගෝලීය වශයෙන් මෙම තත්වයට දක්වන ප්‍රතිචාර සඳහා තනි රටක් වශයෙන් විශාලතම ආධාර ප්‍රමාණය ලබාදෙන්නේ ඇමරිකාවයි.

COVID-19 වෛරස ව්‍යාප්තිය ආරම්භ වූ තැන් පටන් මේ දක්වා එක්සත් ජනපද රජය වසංගත තත්වය මැඩලීම සඳහා විශේෂයෙන් ඉලක්ක කරමින් හදිසි අවස්ථා සෞඛ්‍ය, මානුෂීය, ආර්ථික සහ සංවර්ධන අධාර වශයෙන් ඩොලර් මිලියන 775කට අධික මුදලක් විවිධ රජයන්, අන්තර්ජාතික සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන වෙත ලබාදී තිබේ. කොන්ග්‍රසයෙන් ලබාදුන් මෙම අරමුදල් රටවල් 120කට අධික සංඛ්‍යාවක මහජන සෞඛ්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, සෞඛ්‍ය සේවා පහසුකම් ආරක්ෂා කිරීම සහ විද්‍යාගාර, රෝග ආවේක්ෂණ හා ශීඝ්‍රයෙන් ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන් වර්ධනය කිරීම මගින් ජීවිත බේරාගනු ඇත.

ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් සහ USAID වෙතින් මෙතෙක් ලබාදුන් COVID-19 උපකාර අතරට පහත දැක්වෙන ආධාර ඇතුළත් වේ:

- **සංස්පර්ශක බෝවන රෝග පැතිරීම් සහ ගෝලීය සෞඛ්‍ය වැඩසටහන් ගිණුම සඳහා වන USAID හි ගෝලීය සෞඛ්‍ය හදිසි අවස්ථා සංචිත අරමුදලින් හදිසි අවස්ථා සෞඛ්‍ය උපකාර වශයෙන් ඩොලර් මිලියන 200කට ආසන්න මුදලක් ලබාදීම.** COVID-19 හේතුවෙන් බලපෑමට සහ අවදානමට ලක් වූ, සංවර්ධනය වෙමින් පවතින රටවල්වල වෛරසය හේතුවෙන් සිදුවන හානි අඩුකිරීමට හා ඒ සඳහා ප්‍රජාවන් සූදානම් කිරීමට සිදුකළ මැදිහත්වීම් සඳහා මෙම මුදල්වලින් ප්‍රමුඛතාවය ලබා දෙයි.

- **USAID හි අන්තර්ජාතික ආපදා සහය ගිණුමෙන් (IDA) ඩොලර් මිලියන 300කට ආසන්න මුදලක් මානුෂීය සහය සඳහා ලබාදීම.** සිදුවෙමින් පවතින මානුෂීය අර්බුදයෙන්

බලපෑමට ලක්වූ ජනතාව, විශේෂයෙන්ම අවතැන්වූ පුද්ගලයින් මුහුණ දෙන අධික අවදානම්පාත්‍රතාවය හේතුවෙන්, කඳවුරු හා අවිධිමත් ජනාවාසවල බරපතළ ලෙස රෝග ව්‍යාප්තිය සඳහා ඇති අධික අවදානම හේතුවෙන් සහ එවැනි ජන කොටස් අතරේ විසමානුපාතික අන්දමින් සිදුවෙතැයි අපේක්ෂිත මරණ ප්‍රමාණය හේතුවෙන් එවැනි ජනකොටස් කෙරෙහි මෙම අරමුදල්වලින් ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

- **ආර්ථික උපකාර අරමුදලින් (ESF) ඩොලර් මිලියන 150කට අධික මුදලක් ලබාදීම.** වෛරසය හේතුවෙන් ඇතිවන හානි අඩුකිරීමට ගන්නා කෙටිකාලීන ක්‍රියාමාර්ග සඳහා සහය දෙමින් සහ වසංගතය හේතුවෙන් දීර්ඝ කාලීනව දෙවැනුව ඇතිවන බලපෑම් ආමන්ත්‍රණය සඳහා උපකාර ලබාදෙමින් මෙම අරමුදල් ඇමරිකානු විදේශ ප්‍රතිපත්ති ලැදියාවන් ප්‍රවර්ධනය කරනු ඇත.
- **රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජනගහණ, සරණාගත සහ සංක්‍රමණ කාර්යාංශය හරහා, සංක්‍රමණ සහ සරණාගත තැනැත්තන්ගේ සහය ගිණුමෙන් (MRA) ඩොලර් මිලියන 130කට අධික මුදලක් මානුෂීය ආධාර වශයෙන් ලබාදීම**. සරණාගතයින්, අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් හා ඔවුන්ට සත්කාරකත්වය ලබාදෙන ප්‍රජාවන් මෙන්ම අනෙකුත් සංක්‍රමණිකයින් හා අනෙකුත් අවදානම්පාත්‍ර ජනකොටස් කෙරෙහි වසංගතය හේතුවෙන් එල්ල වී ඇති අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා ගෝලීය මෙන්ම දේශීය වශයෙන් සිදුකරන මානුෂීය ප්‍රතිචාරදැක්වීමේදී ජාත්‍යන්තර සංවිධානවලට සහ රාජ්‍ය නොවන සංවිධානවලට මෙම අරමුදල් උපකාරී වනු ඇත.

පසුගිය දශකය තුළ පමණක් ඇමරිකාවෙන් ගෝලීය සෞඛ්‍ය සඳහා අරමුදල් වශයෙන් ලබාදුන් ඩොලර් බිලියන 100කට අධික මුදල සහ විදේශවලට මානුෂීය ආධාර වශයෙන් ලබාදුන් ඩොලර් බිලියන 70කට ආසන්න මුදලට අමතරව මෙම නව ආධාර මුදල් ලබාදී තිබේ.

එක්සත් ජනපදයේ මෙකී සෘජු අරමුදල් සැපයීම්වලට අමතරව, අපගේ 'සමස්ථ ඇමරිකාවම' (All-of-America) එළඹුමෙන් ඇමරිකානු පෞද්ගලික ව්‍යාපාරවල, ලාභ අපේක්ෂා නොකරන කණ්ඩායම්වල, පුණ්‍යායතනවල, ආගම්-පාදක සංවිධානවල සහ පුද්ගලයින්ගේ ත්‍යාගශීලීත්වයෙන් ලෝකය වටා බොහෝදෙනාට උපකාර කරනු ලැබේ. සමස්ථයක් ලෙස, ඇමරිකානු ජාතිකයින් විසින් COVID-19 වෛරසයට දක්වන ගෝලීය ප්‍රතිචාරය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන පරිත්‍යාග හා ආධාර වශයෙන් ඩොලර් බිලියන 6.5කට ආසන්න ඇස්තමේන්තුගත මුදලක් කැපකර තිබේ.

වඩාත්ම හදිසි අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ඇමරිකානු රජයේ දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන විදේශ ආධාර ප්‍රමුඛතා අනුපිළිවෙල සම්බන්ධීකරණයේ නියැළෙමින් තම වැයම් හරහා ඇති කෙරෙන

බලපෑම උපරිමය කරා ගෙනයෑමට කටයුතු කරනු ලැබේ. රාජ්‍ය දෙපාර්තමේන්තුව සහ USAID හරහා පහත දැක්වෙන ආධාර ලබාදීමට එක්සත් ජනපදය කටයුතු කර ඇත:

- සැපයුම්-දාම කළමනාකරණය, නව හවුල්කාරීත්ව, අධීක්ෂණය හා ඇගැයුම් සහ තවත් දෑ සඳහා සහය ලබාදෙන වැඩසටහන් ඇතුළුව ගෝලීය හා කළාපීය වැඩසටහන්කරණය සඳහා ජාත්‍යන්තර සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන හරහා දළ වශයෙන් ඩොලර් මිලියන 35.5ක මුදලක් ලබාදෙමින් පවතියි.
- සරණාගතයින්, අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන් සහ ඔවුන්ට සත්කාරකත්වය දක්වන ප්‍රජාවන් මෙම වසංගතය හේතුවෙන් මුහුණ දී සිටින අභියෝග ආමන්ත්‍රණය කිරීම පිණිස COVID-19 සඳහා දක්වන ගෝලීය ප්‍රතිචාරයට MRA මානුෂීය ආධාර වශයෙන් ඩොලර් මිලියන 8ක් ලබාදී ඇත.
- USAID හි ප්‍රජාතන්ත්‍රවාදය, ගැටුම් හා මානුෂීය ආධාර සඳහා වන කාර්යාංශය (DCHA) හරහා ESF ඩොලර් මිලියන 5ක් ලබාදී ඇති අතර එම මුදල් පහත දැක්වෙන කාර්යයන් සඳහා සිවිල් සමාජ සංවිධානවලට සහය ලබාදෙනු ඇත: පුරවැසි-මූලික පාලනය ප්‍රවර්ධනය කිරීම; මාධ්‍යවේදීන්ට සහ සිවිල් සමාජ සංවිධානවලට ඇති නීතිමය ආරක්ෂාව සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම තුළින් මාධ්‍ය හා ප්‍රජා නිදහස සඳහා ගරුත්වය ප්‍රවර්ධනය කිරීම; පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සීමාකිරීම සඳහා COVID-19 සම්බන්ධ හදිසි අවස්ථා නීති යොදාගෙන ඇති ස්ථානවල අවශ්‍ය කරන නීතිමය සහය ලබාදීම; මහජන සෞඛ්‍ය ප්‍රතිචාර තුළින් වෙනස්කොට නොසලකන බව හා කොන්වී ඇති කණ්ඩායම් කෙරෙහි COVID-19 සම්බන්ධයෙන් දෝෂාරෝපණ හා අපකීර්තිය එල්ල කිරීමට දරන වෑයම් මැඩලන බව සහතික කරගැනීම; මාධ්‍යවල අවංකත්වය සහ COVID-19 සම්බන්ධයෙන් වගකිවයුතු තොරතුරු සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම; වැරදි තොරතුරු සහ බොරු තොරතුරු ප්‍රචාරය කිරීම මැඩලීම; ස්වාධීන මාධ්‍ය ආයතනවල මූල්‍ය තිරසාරත්වය සහතික කරගැනීම සහ මානව හිමිකම් ආරක්ෂකයින් සිදුකරගෙන යන වැදගත් ක්‍රියාවන් සඳහා සහය ලබාදීම.
- USAID හි ආර්ථික වර්ධනය, අධ්‍යාපනය සහ පරිසරය සඳහා වන කාර්යාංශය (E3) හරහා ESF ඩොලර් මිලියන 4.3කට ආසන්න මුදලක් වෙළඳාම සහ අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශය ව්‍යාප්ත කිරීම පිණිස ලබාදී තිබේ. දළ වශයෙන් ඩොලර් 750,000ක් පමණ යොදාගනිමින් COVID-19 සම්බන්ධයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය දක්වන ප්‍රතිචාර සඳහා හවුල්කාර රජයන් හා USAID මෙහෙවර වෙත තාක්ෂණික උපකාර ලබාදීමට සහ හදිසි අවස්ථාවේ වැඩිවූ ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වර්ධනය කිරීමට ද; අර්බුදකාරී

අවස්ථාවල දුරස්ථ අධ්‍යාපනය සඳහා වන ගෝලීය ක්‍රියාකාරී කණ්ඩායමක් නිර්මාණය කිරීමට ද; සංවර්ධනය වෙමින් පවතින රටවල දුරස්ථ අධ්‍යාපනය සම්බන්ධයෙන් අන්තර්ජාලය හරහා අධ්‍යාපන විශිෂ්ටත්ව මධ්‍යස්ථානයක් දියත් කිරීමට ද USAID විසින් කටයුතු කරනු ඇත. තවද, ඩොලර් මිලියන 3.5ක් වැය කරමින් වෛද්‍ය උපකරණ හා පරීක්ෂණ කට්ටල/ උපකරණ සම්බන්ධයෙන් වන වෙළඳ බාධක අඩු කරගැනීමට ගෝලීය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව සඳහා උදවු දීමටත් වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට රාජ්‍යයන්හි අනුකූලතාවය වැඩිදියුණු කරගැනීමට හවුල්කාර රජයන්ට සහය ලබාදීමටත් USAID විසින් කටයුතු කරනු ඇත.

- USAID හි ප්‍රත්‍යස්ථබව සහ ආහාර සුරක්ෂිතතාවය සඳහා වන කාර්යාංශය (RSF) වෙත ආර්ථික ආධාර අරමුදල් වශයෙන් ලබාදුන් ඩොලර් මිලියන 8, ගෝලීය ආහාර හා කෘෂිකර්ම පද්ධතියට වසංගතය හා සම්බන්ධිතව ඇතිවන කම්පනයන්හි හානි අඩුකිරීම සඳහා දරනු ලබන බහු-පාර්ශවීය වැයමක් සඳහා යොදාගැනෙනු ඇත. ඇතැම් නැගී එන ආර්ථික විසින් වසංගතයට දක්වන ප්‍රතිපත්තිමය ප්‍රතිචාර හේතුවෙන් දැනටමත් එම රටවල දේශීය ආහාර පද්ධතියට අහිතකර බලපෑම් එල්ල වී ඇති අතර ආහාර අනාරක්ෂිතභාවය මෙන්ම කුසගින්න හා මන්දපෝෂණය වර්ධනය වන ගැටළු බවට පත්වී තිබේ. වඩාත් ප්‍රගාමී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රටවල්වලට උපකාරී වන දත්ත හා විශ්ලේෂණ ලබාදීමටත්; වඩාත්ම බරපතළ බලපෑම්වලට සාර්ථකව මුහුණදීමට හැකියාව සලසන ව්‍යාපාර ආකෘතිවලට මාරුවීම සඳහා කුඩා හා මධ්‍යම පරිමාණ ආහාර හා කෘෂි ව්‍යාපාරවලට සහය දීමටත්; COVID-19 තත්වය යටතේ පාරිභෝගිකයින්ට ආරක්ෂා සහිතව ආහාර හා කෘෂි ක්‍රියාකාරකම්වලට සම්බන්ධවිය හැක්කේ කෙසේද යන්න පිළිබඳව තොරතුරු නැගී එන ආර්ථිකයන්හි ශීඝ්‍රයෙන් බෙදාදීමටත් USAID විසින් කටයුතු කරනු ඇත. කුඩා හා මධ්‍යමපරිමාණ කෘෂි ව්‍යාපාරවලට මූල්‍යකරණය සැපයුම සඳහා මූල්‍ය අංශයේ හවුල්කරුවන් සමගින් සහයෝගීතාවයෙන් ක්‍රියාකිරීම ද මෙම හවුල්කාරීත්වයට ඇතුළත් වේ.

- ESF අරමුදල්වලින් ඩොලර් මිලියන 2ක් රාජ්‍ය ලේකම්තුමාගේ ගෝලීය කාන්තා ගැටළු කාර්යාලයේ (S/GWI) කටයුතු සඳහා වෙන්කරමින් ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට (GBV) මුහුණ දුන් අයට හදිසි අවස්ථා සහන පවතින බව සහතික කරගැනීමටත් ඔවුන්ට වඩාත් වැඩි ආරක්ෂාවක් සහ යුක්තිය කරා ප්‍රවේශය පවතින බවත් සහතික කරගැනීම වෙනුවෙන් යොමුකර තිබේ. GBV හේතුවෙන්, විශේෂයෙන්ම COVID-19 වසංගත තත්වයට අදාළව ඇතිවන ස්ත්‍රීපුරුෂ සමාජභාවීය ආර්ථික, පාලන

සහ ආරක්ෂක බලපෑම් සම්බන්ධයෙන් උද්දේශනය කිරීම සහ ඒ පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාර පැවැත්වීම සඳහා ද මෙම අරමුදලින් සහය ලබාදීමට අපේක්ෂා කරයි.

- UNICEF සහ මානුෂීය කටයුතු සම්බන්ධීකරණය සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන ගණනාවකම විශාලතම සහ වඩාත් විශ්වසනීයම දායකත්වය සපයන්නා වන්නේ එක්සත් ජනපදයයි. ගෝලීය මට්ටමින් සිදුකෙරෙන මානුෂීය, සංවර්ධන, සාමය ගොඩනැංවීමේ සහ අනෙකුත් කාර්යභාරයන් සඳහා එම සංවිධානවලට ඉඩසලසමින්, ඒවායෙහි සංවිධාන ව්‍යුහය පවත්වාගෙන යාමටත් ආධාරක කෘත්‍යයන් පවත්වාගෙන යාමටත් මූලික මෙහෙයුම් අයවැය සඳහා සිදුකරන සැලකියයුතු ආයෝජන එම දායකත්වයට ඇතුළත් වේ.

*මෙම අර්බුදකාරී අවස්ථාවට ප්‍රතිචාර වශයෙන් එක්සත් ජනපද රජය ගෙන ඇති සාකල්‍ය අරමුදල් සැපයීම් පිළිබඳව වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා කරුණාකර F-Press@state.gov සමගින් සම්බන්ධ වන්න.*

*යම්කිසි රටක් තුළ දක්වනු ලබන ප්‍රතිචාර සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමට අවශ්‍ය නම්, press@usaid.gov හරහා USAID සමගින් සම්බන්ධ වන්න. COVID-19 සඳහා ප්‍රතිචාර දක්වමින් සිදුකරන MRA මානුෂීය ආධාර දායකත්වය ලබාදීම් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීම සඳහා, PRM-Press@state.gov හරහා රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජනගහණ, සරණාගතයින් සහ සංක්‍රමණ කාර්යාංශය සම්බන්ධ කරගන්න.*